සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**6 ශ්‍රේණිය** **පළමු වාර පරීක්ෂණය - 2019**

නම ............................................... භූගෝල විද්‍යාව **කාලය පැය දෙකයි**

**උපදෙස් :**
I කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
II කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.

## I කොටස

● අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැනට සුදුසු පිළිතුරු වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

01. හිරු උදාවන දිශාවට මුහුණලා දෑත් දෙපසට දිගුකර සිටගත් විට ඔබගේ දකුණු අත විහිදෙන දිශාවෙන් දක්වෙනුයේ ....................................... දිශාවයි.

(උතුරු / දකුණු / බටහිර)

02. අඩු වේගයකින් හමන සුළං ....................................... නමින්ද හඳුන්වයි.

(සැඩ සුළං / සුළි සුළං / මඳ සුළං)

03. ශ්‍රී ලංකාවේ අනුරාධපුරය සහ පොළොන්නරුව යන ඓතිහාසික නගර දෙක අයත් වන්නේ ....................................... පළාතටය.

(උතුරු මැද / මධ්‍යම / ඌව)

04. පෘථිවියට උෂ්ණත්වය සහ තාපය ලැබුනුයේ ....................................... මගිනි.

(තාරකා / සූර්යයා / ග්‍රහලෝක)

05. උතුරු දිශාව සහ බස්නාහිර දිශාව අතර ....................................... දිශාව පිහිටා ඇත.

(ගිණිකොන / නිරිත / වයඹ)

● ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශ කියවා එය නිවැරදි නම් (√) ලකුණද, වැරදි නම් (×) ලකුණද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

06. ශ්‍රී ලංකාවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටා ඇත. (.......)
07. භූමි සැලැස්මක් ඇඳීමේදී දිශාව සටහන් කිරීම අවශ්‍යම අංගයක් නොවේ. (.......)
08. කාලය හා ප්‍රදේශ අනුව කාලගුණික තත්වයන්ගේ වෙනසක් ඇති නොවේ. (.......)
09. වර්ෂාව ඇති වීමට පෙර අහසෙහි අඳුරු පැහැති සණ වලාකුළු දක්නට ලැබේ. (.......)
10. සුළං හමා යන දිශාව අනුව ගස්වල අතු නැමී පවතී. (.......)

● අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර, දී ඇති පිළිතුරු අතුරින් තෝරා යටින් ඉරක් අඳින්න.

11. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතට අයත් වන දිස්ත්‍රික්කයක් වන්නේ පහත ඒවායින් කුමක්ද ?

01. බදුල්ල 02. කළුතර
03. අම්පාර 04. කෑගල්ල



LIVEWORKSHEETS

12. කාලගුණික තොරතුරු දැන ගැනීම වඩාත්ම ප්‍රයෝජනවත් වන්නේ පහත සඳහන් කවරෙකුටද?

01. ගුරුවරුන්ටය　　02. වෛද්‍යවරුන්ටය

03. ධීවරයින්ටය　　04. වඩු කාර්මිකයින්ටය

13. වර්ෂාපතනය හිඟ වීම නිසා ඇති විය හැකි ප්‍රතිඵලය මින් කුමක්ද?

01. ගංවතුර　　02. සුළි සුළං

03. නාය යෑම්　　04. නියගය

14. සුළගේ දිශාව මනින උපකරණය අඩංගු පිළිතුර කුමක්ද?

01. වේගමානය　　02. අනිල මානය

03. උෂ්ණත්ව මානය　　04. සුළං දිශා දර්ශකය

15. ශ්‍රී ලංකාවේ මීදුම සහිත කාලගුණයක් බහුලවම දක්නට ලැබෙන දිස්ත්‍රික්කය කුමක්ද?

01. මොණරාගල　　02. වව්නියාව

03. මන්නාරම　　04. නුවරඑළිය

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.**

ශ්‍රී ලංකාවේ ඇති කුඩාම පරිපාලන ඒකකය ග්‍රාම නිලධාරි කොට්ඨාසයයි. එය සෑදී ඇත්තේ ගමක් හෝ ගම් කිහිපයක් එකතු වීමෙනි. සෑම ග්‍රාම නිලධාරි කොට්ඨාසයකටම නිශ්චිත 16. ............................................ හා 17. ...................................... තිබේ. ග්‍රාම නිලධාරි කොට්ඨාස කිහිපයක් එකතු වීමෙන් 18. ............................ කොට්ඨාසය සෑදී ඇත. 19. ............................ දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් එකතු වීමෙන් 20. .......................... සෑදී ඇති අතර එය ශ්‍රී ලංකාවේ විශාලම පරිපාලන ඒකකයයි.

(දිස්ත්‍රික්ක, නමක්, පළාත, අංකයක්, නගර, ප්‍රාදේශීය ලේකම්, උප දිසාපති)



LIVEWORKSHEETS